යුද සිනමාවේ චරිත සොල්දදුවාගේ සිරිත හා තිස්සලාගේ "බයිලා පිරිත"

රියර් අද්මිරාල් සරත් වීරසේකර

සරත් වීරසේකර

තිස්ස අබේසේකර මහතා විසින් පසුගිය ඉරිද දිවයිනට ලියන ලද ලිපිය කියවා මෙය ලිවීමට සිතුවෙමි. මා නෞකාවෙන් ගොඩබැස සිනමා විචාරයට පිවිසීම 'දුකක්' බවද මාගේ ප්‍රතිචාරයට ගුණදාස අමරසේකරයන් ප්‍රණාමය' දැක්වීම 'ඛේදවාචකයක්' ලෙසද ඔහු පෙන්වා දී ඇත. එසේම මාගේ ප්‍රයත්නය 'බල්ලාගේ වැඩේ බූරුවා' කිරීමක් යැයිද එය 'බෝමළුවේ බයිලා ගැයීමක්' වැනි බවද කියමින් නොයෙකුත් අවලාද නගා තිබූ අතර ලිපියේ සෙසු කොටස වැයකර තිබුණේ ගුණදාස අමරසේකර ගුරින්ව හෙළා දැකීමටය.

තිස්ස අබේසේකර යනු අප ඉතා ගෞරවයෙන් සැලකූ, කෘතහස්ත ප්‍රතිභාපූර්ණ සිනමා කලා ගුරයෙකි. එවන් ප්‍රවීන කලාකරුවකු සිංහල භාෂාවේ කොතෙකුත් සුගම සුන්දර වදන් තිබියදීත් මෙවන් වූ කර්කෂ යෙදුම් භාවිත කිරීම මාගේ මවිතයට හේතු විය. නමුත් ඔහු මට වඩා වයසින් වැඩිමහල්ය. වැඩිමහල්ලන්ට ගරු කිරීම දෙමාපියන්ගෙන් සහ පාසලින් මෙන් හමුදවෙන්ද අප උගත් සාරධර්මයකි. එසේම, කෙතරම් වැඩිහිටියෙක් හෝ ප්‍රාඥයෙක් වුවද ඔහුගේ අදහස් හා එකඟ නොවන්නේ නම් එයද කිසිම පැකිලීමකින් තොරව, ගෞරව පූර්වකව ඉදිරිපත් කිරීමටද අපේ ගුරුවරු අපට කියාදී ඇත. මෙම ලිපිය ලියනුයේ එවන් වූ භාවාර්ථයක් සිත්හි පෙරදැරි කරගෙනය.

තිස්ස අබේසේකරයන් මා හමුද නිල ඇඳුමින්ම සිනමා විචාරයට පිවිස ඇති බැව් පවසයි. නමුත් මා ලියූ ලිපි පෙළින් මෙන්ම ඔහු සමඟ පැවති සාකච්ඡාවේදීද පවසා සිටියේ අදාළ 'යුධ' සිනමා කෘතීන් සම්බන්ධව අදහස් ප්‍රකාශ කළේ සිනමා විචාරකයකු ලෙස නොව යුද්ධයට සෘජුව සම්බන්ධ සොල්දදුවෙක් ලෙසින් පමණක් බවය. මෙය ඉතා පැහැදිලිව කියා තිබියදීත් ඔහු මා සිනමා විචාරයට අවතීර්ණ වී ඇති බවත්, නිල ඇඳුමින් සිනමාව ගැන කතා කිරීම 'බෝමළුවක බයිලා' කීම වැනි විහිළුවක් බවත් අවධාරණය කරයි. මෙයින් හැඟෙන්නේ සොල්දදුවෙකුට සිනමාවක් නරඹා ඒ ගැන තමන්ට සිතන යමක් පැවසීමට විශ්‍රාම ගොස් නිල ඇඳුම ගලවන තුරු බලා සිටිය යුතු බවය. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ප්‍රකාශකයෙක්ද අපට මේ සම්බන්ධයෙන් දෝෂාරෝපණය කොට ඇත. එහි තේරුම නම් සිනමා කලාකරුවනට සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරකරුවන්ද ඇතුළුව ලංකාවේ සෑම අයකුටම සාහේ තම අදහස් ප්‍රකාශ කිරීමට පූර්ණ නිදහස ඇති නමුත් 'සොල්දදුවා' යන අමුතු සත්වයාට පමණක් එම අයිතිය සපුරා තහනම් බවකි. මෙම සිනමාකරුවන්ට සහ නිදහස් මාධ්‍යධරයන්ට අනුව රටට කුමන පුද්ගලයෙක් කුමන මාදිලියේ විපතක් කරමින් සිටියද, සොල්දදුවාගේ සහ ඔහුගේ බිරියගේ ආත්ම ගෞරවයට කෙතරම් හානි සිදු කළද, සොල්දදුවාගේ එකම කාර්ය භාරය වනුයේ මුඛවාඩම් බැඳගෙන ඔවුන් සෑම ආරක්ෂා කිරීම පිණිස සතුරා ඉදිරියේ සටන් වැද එක්කෝ මිය යෑමය. නැතිනම් අතපය අහිමි කර ගැනීමය. 'බල්ලා' ලෙස කවුරු හඳුන්වා ඇතත් තිස්ස අබේසේකරයන් සොල්දදුවාව 'බූරුවා'ට ඇන්දීමට මහන්සි ගන්නේ ඒ නිසා විය යුතුය.

සිනමා විචාරයට පිවිසීම සඳහා අවශ්‍ය හසළ ශාස්ත්‍රීය දැනුම, සාහිත්‍ය ඥානය, භාෂා කෞශල්‍යය, විචාරක සම්මුතීන්, චර්යා පද්ධති පිළිබඳ දැනුම අප සතුව නොමැත. එසේම සිනමා කෘතියක් කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුමින් ද අප අසම්පූර්ණය. මන්ද තිස්ස අබේසේකර වැනි ජ්‍යෙෂ්ඨ සිනමා පඬිවරුන් පොතපත පරිහරණය කරමින්, ජාතික සහ අන්තර්ජාතික සමුළුවලට සහභාගි වෙමින්, සම්මාන ලබමින්, කලා ක්ෂේත්‍රයේ විවිධ වූත්, අනන්ත වූත් අත්දැකීම් ලබමින් ජීවිතය පුරාම තම අදාළ කලා ශිල්ප ප්‍රගුණ කරමින් සිටියදී, සොල්දදුවන් ලෙස මුළු ජීවිතය පුරාම අප කළේ යුද්ධ කිරීම පමණක් බැවිනි. පාසලේදී ලබාගත් සාහිත්‍ය දැනුමට අමතරව අපට ලබාගත හැකි වූයේ යුද්ධ කරන අතරවාරයේදී කලාතුරකින් ලැබෙන මඳ විරාමයකදී කියවූ පොතපත, සඟරාවක් ඇසුරින් ලද දැනුම පමණි. කෙසේ වුවද එවන් වූ අල්පේච්ඡ වූ සාහිත්‍ය දැනුමකින් සිනමා විචාරයක් බඳු භාරදූර කාර්යයකට යොමුවිය නොහැකි බව තේරුම් ගැනීමට තරම් කලා ඥානයක් අප සතුව ඇති බැව් නම් ආඩම්බරයෙන් යුතුව කිව යුතුව ඇත. එසේ අප පවසා සිටියදීත් ඒ බැව් තේරුම් ගැනීමට තරම් ඥානයක් තිස්ස අබේසේකරට නොමැතිවීම ඇත්තෙන්ම කණගාටුවට කරුණකි.

තිස්ස අබේසේකරයන් හා පැවැති සාකච්ඡාවේදී 'මදර් ඉන්දියා' වැනි චිත්‍රපටයක් හදන ලෙස මා ඔහුගෙන් ඉල්ලා සිටි බවත් එහිදී එසේ හදන චිත්‍රපටයට ගීත කීයක් අඩංගු කළ යුතුද සහ කුමන ආකාරයෙන් ඒවා භාවිත කළ යුතුද යන්න ගැන මාගෙන් උපදෙස් ලබා ගැනීමට ඔහුට අමතක වූ බවත් ඔහු කියා ඇත. ඇත්ත වශයෙන් මා එවැනි ඉල්ලීමක් තිස්ස අබේසේකරගෙන් කළේ නැත. එබැවින් ඔහු එසේ සඳහන් කළේ ඇයිදැයි නොදනිමි. ගෞරව ලබන වැඩිමහල්ලන් බොරු කියන්නේ නැත. නමුත් වයසට යෑමේදී අමතකවීම ස්වාභාවික බැවින් ඊට අපට සමාව දිය හැක. කෙසේ වුවද, කාගෙන්වත් එවන් ඉල්ලීමක් මෙතෙක් කර නැති නමුත්, සදාචාරය අගයන, රටේ සංස්කෘතියට ගරු කරන, තමන් ජනිත වූ මාතෘ භූමියට අවංක ආදරයක් තිබෙන, සුන්දර දැහිතකාමී කලාකරුවන්ගෙන් එම ඉල්ලීම කිරීමට මා ලහදීම බලාපොරොත්තු වෙමි. කරුණු එසේ වුවද වැරැදීමකින් හෝ මා ඒ ඉල්ලීම ඔහුට යොමු කොට ඔහුද තමන්ට අමතක වූවා යැයි කියන ගීත සංඛ්‍යාව පිළිබඳව උපදෙස් මාගෙන් ඉල්ලා සිටියා නම් කොතරම් කදිම දැයි මට දැන් සිතේ. එය එසේ වූවානම් උපදෙස් වශයෙන් ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ 'රේඛාව' චිත්‍රපටයෙහි අඩංගු ගීත සංඛ්‍යාවම එහි ඇතුළත් කරන මෙන්ද, ඒවා කුමන ආකාරයෙන් භාවිත කළ යුතුද යන්න ගැන අවබෝධයක් ලබා ගැනීමට 'මදර් ඉන්දියා' අධ්‍යක්ෂණය කළ මෙහෙබුබ් ඛාන්ද, වී. ශාන්තරාම්, ගුරුදත් යනාදීන්ද, 'බෝඩර්' චිත්‍රපටයේ අධ්‍යක්ෂවරයාද හමුවීමට ඉන්දියාවේ චාරිකාවක යෙදෙන මෙන් මට ඔහුට යෝජනා කළ හැකිව තිබිණ. ජාතියේ වාසනාවකට හෝ එවන් යෝජනාවකට එකඟවූවා නම් උක්ත ඉන්දීය සිනමා අධ්‍යක්ෂවරුන් විසින් තිස්ස අබේසේකර සහ ඔහුගේ ගෝලබාලයනට සිනමාවක ගීත භාවිතය සම්බන්ධව කියාදෙන අතරම 'කලාව සහ දේශප්‍රේමය' යනු කුමක්ද යන්න ගැනත් පැහැදිලි කරදෙනු ඇත.

වසර සිය ගණනක් මුළුල්ලේ මුතුන් මිත්තන් විසින් ජීවිත පරිත්‍යාගයෙන් රැකදුන් 'දේශය' 'සුරක්ෂිත කරනු වස්, සියලුම ජනතාව ඒකරාශි කිරීමට ඇවැසි, 'ජාතික අභිමානය' හදවත් තුළ ජනිත කරවීමට, සිනමා කෘතියක් සියුම් ලෙස උපයෝගී කරගන්නා අන්දම ගැන හිස අතගා මහත්වූ කරුණාවෙන් යුතුව කියා දෙනු ඇත. ලක්මාතාව දූෂණය කරන්නට දිව එන ත්‍රස්තයාට එරෙහිව සටන් කරන ජාතියේ දූපුතුන් බින්දුවට දැමීමට නොව කලාකරුවන්ගේ වගකීම සහ යුතුකම වන්නේ උන් හද දිරිමත් කිරීමට සහය වන නිර්මාණ කිරීම බැව්, මනාව පසක් කොට දෙනු ඇත. ඉන්දීය සිනමාවේ දශක ගණනාවක දිගු ගමන තුළ පහළ වූ සිය ගණනක් 'දේශප්‍රේමී' චිත්‍රපටවල තේමාවන්වලින් තිස්ස අබේසේකර ඇතුළු ගෝලබාලයන්ගේ මොළ සෝද හරිනු ඇත. එසේ වූවානම් කෙතරම් අපූරුද? නමුත් අහෝ ඛේදයකි. ලාංකික සිනමා ඉතිහාසය තුළ මෙතෙක් ගෙන නොතිබූ ඓතිහාසික පියවරක් ගැනීමට තිබූ ස්වර්ණමය අවස්ථාවක් ගිලිහී ගොසිනි. එය මහත් දුකකි. තවද එවැනි කඩඉමක් පෙනෙන තෙක් මානයේවත් දක්නට නොමැත. එය ඛේදවාචකයකි. අපගේ මීළඟ සාකච්ඡාවේදීවත් මගෙන් එවන්වූ උපදෙසක් ලබා ගැනීමට ඔහුට අමතක නොවේවායි මා ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

මුහුදු කොටි සටනට එනවිට උන්ට පිරිත් කියන්නැයි අපට නොකියන බව තිස්ස අබේසේකර පවසයි. මහ මුහුදේ තිබෙන යුධ නෞකාවකට විහිළුවට හෝ ගොඩවැදී නැති හෙයින් ඔහු එසේ කීවත් අප පුදුමයට පත්විය යුතු නැත. නමුත් සතුරාට වුව මෛත්‍රී කරන්නැයි ලොව පහළ වූ සියලුම ශ්‍රේෂ්ඨ ආගමික ශාස්තෘවරයන් විසින් දේශනා කර තිබේ. තිස්ස අබේසේකරයන්ද, අප දන්නා පරිදි, ආගම දහමට ඉතා ලැදි, සදාචාරය අතිශයින්ම අගයන, ඉතා නිවුණු, ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් නිසා සතුරාට මෛත්‍රිය පෑ යුතුයි කීවද, කිරිම කෙසේ වුවත් 'එම ඔවදන' මහත්වූ ගෞරවයෙන් පිළිගැනීමට අපි සූදානම්ව සිටිමු. නමුත් ඔහු සහ ඔහුගේ ගෝලබාලයන් අද කරන්නේ එවැනි වූ අවවාදයක් හෝ දීම නොව, පිරිත් නූල්ද යොදගෙන සතුරා හා සටන් වදින සෙබළාගේ කකුලෙන් ඇදීමට මාන බැලීම නොවේද? මෙවන් තත්ත්වයක් මත අපේ මුවගට සිනහවක් නැඟෙන්නේ තිස්ස අබේසේකරයන් අපට සතුරා ඉදිරියේ පිරිත් කිව යුතු යැයි නොකියමුයි පවසමින්, තම නිර්මාණයන් තුළින් සතුරා සමඟ සටන් වදින සෙබළා සහ ඔහුට දිරිදෙන බිරිය නිර්දය ලෙස හෙළා දකිමින්, ජාතික ආරක්ෂාවට කැපවී සිටින සමස්ත සෙබළ බල මූලවටම ජීවත්ව සිටියදීම 'පාංශුකූලය' දීමට දරන වෑයම පෙනී යන නිසාය. මෙබඳු පුද්ගලයන් නැවත පියවි සිහියට පැමිණවීම සඳහා, ඔවුනට පිරිත් පැන් ඉසීම හැර අපට වෙන කළ යුතු දෙයක් නම් නොපෙනේ.

තිස්ස අබේසේකරයන් මා හඳුන්වා ඇති ආකාරය ගැනද යමක් පැවසිය යුතු යැයි හැඟේ. මා නෞකාවෙන් ගොඩබැස චිත්‍රපට විචාරයට ප්‍රවිෂ්ට වී ඇති බවයි. අප නෞකාවෙන් ගොඩබැස එවන් වූ කාර්යයකට හෝ සිනමා නිර්මාණයකට හෝ යොමු වෙතැයිද එයින් තමා සතුව ඇති 'කලා ඒකාධිකාරය' බිඳ වැටේ යැයිද අනිසි බියක් ඔහු විසින් කිසිසේත්ම ඇතිකරගත යුතු නැත. මන්ද, අප හමුදවේ සිටින තාක්කල්, අපේ පණනළ රැදෙන තුරු, කුමන හේතුවක් නිසා හෝ නෞකාව හැර නොයන බැව්නි. සතුරා අතින් විනාශ වුවද අප නෞකාවත් සමඟම මුහුදේ පතුලටම කිඳබැස මිය යනු මිසක නෞකාව හැරදමා පැන යෑමට සැරසෙන්නේ නැත. ඒ අප ලත් පුහුණුවයි. ඒ පුහුණුව, මාතෘ භූමියට ඇති සෙනෙහස තුළින්ද, දේශය පිළිබඳ හැඟීම තුළින්ද, ඔපවත්ව තිබේ. එම හැඟීම නිරතුරුව දරා සිටීමට අප පන්හරය ලබා ගන්නේ වසර 2500 ක ඉතිහාසය තුළ අප ලත් ජයග්‍රහණයන් මතිනි. එයට නොමඳ ශක්තිය ලබා දෙන්නේ අපව අගයන ආදරණීය රටේ සෙසු ජනතාවයි. එම ජනතාවට අපේ ප්‍රණාමය පුද කරමු. කෙසේ වුවද ජාතික ආරක්ෂාව නමැති මහා නෞකාව නිරුපද්‍රිතව තබා ගැනීමට සෙබළුන් මෙන්ම, පොලිසිය සහ විශේෂ කාර්ය බලකායද අද ඉතසිතින් යුතුව ඇපකැප වී සිටී. එම සොල්දදුවන්ගේ දිරිය වැඩීමට ක්‍රියාන්විත පෙදෙස් හි නොමිලේ ගීත ප්‍රසංග පවත්වමින්ද, වේදිකා නාට්‍ය වැනි දේ පෙන්වමින්ද, අපේ ආදරණීය කලාකරුවන් සහ සිනමා නළුනිළියන් මෙතෙක් අප වෙනුවෙන් කර ඇති සුවිශේෂ සේවයට අපි සද ණයගැති වෙමු. එසේම 'ජාතික ආරක්ෂක නෞකාව' විනාශ කිරීමට පැමිණෙන 'ත්‍රස්තවාදය' නමැති බෝට්ටුවල 'දේශද්‍රෝහී' එන්ජින් යන්ත්‍රවලට විවිධ මාදිලියේ 'ඉන්ධන' සැපයීමට සැදී පැහැදී සිටින නානාතරමේ ජාතිය පාවා දෙන්නන් අතර අතලොස්සක් වූ කලාකරුවන් යැයි කියා ගන්නා පිරිසක්ද සිටිති. එසේම උන්ට උඩගෙඩි දෙන්නන්ද සිටින බැව් අපි දනිමු. අප කරනුයේ ඔවුනට විරුද්ධව අදහස් ප්‍රකාශ කිරීමක් පමණි. එය කිරීමට අප විශ්‍රාම ගොස් නිල ඇඳුම ගලවන තුරු බලා සිටිය යුතු යැයි යමෙක් කියත් නම් එය විහිළුවකි. එවැනි අදහසක් ප්‍රකාශ කිරීමක් 'බෝමළුවේ බයිලා ගැයීමක්' වන්නේද නැත. අපගේ එම කර්තව්‍යය ඇත්ත වශයෙන්ම 'කලාව' නමැති පාරිශුද්ධ වූ 'බෝමළුව'ට බලෙන් අවතීර්ණ වී, එහි ඇති නිසල, ශාන්ත, ප්‍රසන්න පරිසරය කෙළෙසීමට තැත් කරන, බේබද්දන් දෙතුන් දෙනකු වෙන්කර පෙන්වීමට කරන වෑයමකි. උන් පන්නා දැමීම හෝ ඔවුන්ගේ වෛරී සින්දවීම හෝ උන්ට හොර මත්පැන් සපයන 'මුදලාලිට' දඩ ගැසීම හෝ අප සතු කාර්යයක් නොවේ. නමුත් වාසනාවට හෝ එය එසේ සිදුවූවහොත් එය, තෙල්මල් ගෙන ශුද්ධ වූ කලාව නමැති බෝමළුවේ සුන්දර පහස විඳීමට මහත්වූ භක්තියෙන් යුතුව නන්දෙසින් එන ප්‍රේක්ෂක සැදැහැවතුන්ගේද, සමස්ත කලා පුණ්‍ය භූමියේද, අර්ථය සහ යහපත පිණිසම වන බව නම් සක්සුදක් සේ පැහැදිලිය.

උතුරු නැගෙනහිර යුද්ධය විෂය කොට තරුණ සිනමාකරුවන් දෙතුන් දෙනකු විසින් මෙතෙක් නිර්මාණය කර ඇති චිත්‍රපට යුද්ධය හේතුවෙන් සිදුවී ඇති සමාජයීය හා සදාචාර ධර්මයන්ගේ පිරිහීම දෙස වගකීමෙන් හා යථාර්ථවාදීව බැලීමට ගෙන ඇති ප්‍රශංසනීය උත්සාහයක් බැව් තිස්ස අබේසේකරයෝ කියති. එම චිත්‍රපටවල ඇති දුර්ලභ ගනයේ ශිල්ප ප්‍රතිභාවද ඔහුගේ ගෞරවයට පාත්‍රවී තිබෙන අතර, ඒවා යුද්ධය ගැන ගැඹුරින් හා මැදහත් මානව හිතවාදී දෘෂ්ටියකින් බැලීමට ගත් අවංක උත්සාහයක් ලෙසද ඔහු දක්වති. නමුත් එම චිත්‍රපට නැරඹූ සියලු දෙනාම දන්නා පරිදි ඒවායින් සිදුකර ඇත්තේ සිංහල ජාතිය, සංස්කෘතිය පාවාදී, සෙබළා නරුමයකුට අන්ද, සෙබළ බිරිය ලිංගික අසහනයෙන් පෙළෙන ගණිකාවක සේ දැක්වීම පමණි. මෙහි අරුම පුදුම පැත්ත වනුයේ රටක් කෙලෙසන්නට පැමිණෙන ත්‍රස්තයාට එරෙහිව කරන යුද්ධයේ නියැලී සිටින සෙබළා හා ඔහුට දිරිය දෙන බිරිය පාවාදෙන නිර්මාණයන් හැර ත්‍රස්තයාගේ නරුමභාවය, නරුම වැඩ සේම ත්‍රස්තවාදය නිසා දෙමළ ජනතාව පත්ව ඇති ශෝචනීය තත්ත්වය පිළිබිඹු කිරීමට කිසිදු වෑයමක් මෙකී 'මානව හිතවාදීන්' විසින් මෙතෙක් නොගෙන තිබීමයි. චිත්‍ර පටයක වැදගත්ම දෙය වන්නේ එය තුළින් සියුම්ව දෙනු ලබන පණිවුඩයයි. මෙම සිනමා කලාකරුවන් හෙට දිනයේදී සිංහල මිනිසකු තිමි දියණියක සමඟ සංසර්ගයේ යෙදෙන සිද්ධියක්ද අලලා නිර්මාණයක් කොට ජාත්‍යන්තර තරගයකට ඉදිරිපත් කරනු ඇත. යුද්ධයට සම්බන්ධ කිරීමට එම චරිතය යුධ සෙබළකු කිරීමටද ඔවුන් පසුබට නොවනු ඇත. එවිට 'ලිංගික ආශාවන් සන්තර්පනය කිරීම වූ කලී මිනිසාගේ මූලික අවශ්‍යතාවක්' බව පවසමින්ද, 'යුද්ධයෙන් හෙම්බත් වූ සමාජය මෙම සිනමාකරුවා විසින් මානුෂික දෘෂ්ටිකෝණයකින් බලා ඇති වෘත්තිමය ආකාරය ඉතා ප්‍රශංසනීයයි' කියමින්ද, තිස්ස අබේසේකරයන් වැනි අය එම නිර්මාණයද මහත් ලෙස අගයනු නිසැකය. ශිල්ප ප්‍රතිභාව, සිනමා රූපී ලක්ෂණ කොතරම් අග්‍රගන්‍යයේ තිබුණද එම චිත්‍රපටයේ තේමාව තුළින් තම වැදූ මවු බඳු මවුබිමට අනර්ථයක්ම ගෙනාදේනම්, තම සංස්කෘතිය පාවාදේනම්, එමගින් ලබා ගන්නා සම්මාන, සදාචාරය අගයන මවුබිමට ලැදි කිසිවකුත් නම් අගය කරන්ද?

මා සිනමා විචාරකයකු නොවන බව කීම මෙන්ම පහත සඳහන් දේද පුනපුනා කීමට සිදුවීම ගැන කනගාටු වන නමුත් අවසාන වශයෙන් හෝ නැවතත් එය මතක් කර දිය යුතු යැයි මම සිතමි. අද රටේ පවතින්නේ බෙදුම්වාදී ත්‍රස්තවාදයකි. ත්‍රස්තවාදය ඇති වීමට හේතුන් කුමක් වුවද ත්‍රස්තවාදය පරාජය කළ යුතු බැව් සැවොම පිළිගන්නා කරුණකි. රටේ ඒකීයභාවය රැකීමට සෙබළුන් ත්‍රස්තයන් හා දිවි හිමියෙන් සටන් වැද ඇත. දැනට පවතින්නේ එම සටනට තාවකාලිකව විරාමයක් දී තිබීම පමණි. රටේ දැවෙන ජාතික ප්‍රශ්නයක් වන මෙම බෙදුම්වාදී යුද්ධය ත්‍රස්තයා විසින් අන්තර්ජාතිකව සාධාරණීය කරනුයේ නරුම ගති ඇති නොහික්මුණු සෙබළුන් සිටින, අශීලාචාර සිංහලයන්ගෙන් කෙදිනකවත් තම ඉල්ලීම්වලට සාධාරණයක් ඉටුනොවන බැව් පෙන්වන 'ප්‍රචාරක' කටයුතු මගිනි. තිස්ස අබේසේකරයන්ගේ දැඩි ප්‍රශංසාවට පාත්‍ර වී ඇති මෙම සිනමා කෘති සියල්ලෙන්ම දෙන පණිවුඩය ත්‍රස්තයන්ගේ උක්ත දීන ප්‍රචාරක කටයුතු මගින් දෙනු ලබන පණිවුඩයමය. සිංහල ජනතාව අශිෂ්ටයන් බවත්, සිංහල සෙබළා විනයක්, ගුණයක් නැති අමනයෙක් බවත් පෙන්වන මෙම සිනමාව තුළින් සෙබළ බිරිඳ ලිංගික අසහනයෙන් පෙළෙන වෛශ්‍යාවක සේ දක්වා, ඒ තුළින් සෙබළාගේ චිත්ත ධෛර්යයටද සියුම් ලෙස පහර දෙති. ත්‍රස්තයාටද අවශ්‍ය මෙයම නම් මෙවන් නිර්මාණයන් ත්‍රස්ත ප්‍රචාරක ව්‍යාපෘතියේම තවත් කොටසක් නොවන්නේ කෙසේද?

සති කිහිපයකට පෙර අප අතර පැවති සාකච්ඡාවේදී තිස්ස අබේසේකරයන් පවසා සිටියේ මෙම තරුණ කලාකරුවන්ගේ එකම අභිප්‍රාය 'යුද්ධය' පිළිකුල් කරවීම බවය. එයට මා දැක්වූ ප්‍රතිචාරයට ඔහු තවමත් පිළිතුරු සොයමින් සිටින බව මම දනිමි. මා නැවතත් මේ සම්බන්ධයෙන් ලිපි ලිවීමට බලාපොරොත්තු නොවන නිසා එය නැවත ඔහුට මතක් කරදීමට කැමැත්තෙමි. යුද්ධය පිළිකුල් කළ යුත්තේ ත්‍රස්තයාටද, එසේ නැතහොත් රටේ ආරක්ෂාව පතා ත්‍රස්තයාට එරෙහිව යුද වදින සෙබළාටද? සෙබළුන් සියල්ලන්ටම යුද්ධය පිළිකුල් වී හමුදව හැරද ගමරට බලා ගියහොත් රටට කුමක් වේද? ත්‍රස්තවාදියාගේ ජයග්‍රහණයත් එයම නොවේද? එසේනම් මෙම කලාකරුවන් සිංහල ජනතාවට, සෙබළාට සහ සෙබළ බිරියට, යුද්ධය එපා කරවමින් කරන්න හදන්නේ රට බෙදීමට වලිකන ත්‍රස්තයාට වක්‍රව සහයවීමද? රට බෙදීමට අකමැති නම් යුද්ධය පිළිකුල් කළ යුත්තේ අපට නොව ත්‍රස්තයාට නොවේද? ත්‍රස්තයාට සහ උන්ට සහය දෙන්නන්ට යුද්ධය අප්‍රිය වුවහොත් රටේ ඒකීයභාවය සුරක්ෂිත නොවන්නේද? එසේ නම් තිස්ස අබේසේකරගේ ප්‍රශංසාවට පාත්‍ර වූ, මෙතෙක් නිමවුණු 'යුධ' සිනමා සියල්ලන්ගෙන්ම කර ඇත්තේ සෙබළාට යුද්ධය පිළිකුල් කරවීම නම් එයින් හැඟෙන්නේ කුමක්ද? සිංහලයාට සහ සිංහල සෙබළාටම මිස ත්‍රස්තයාට සහ දෙමළ ජනතාවට යුද්ධය එපා කරවීම සඳහා එකදු නිර්මාණයක්වත් මෙතෙක් බිහි නොවීමේ අරුම පුදුම රහස කුමක්ද? ඕනෑම රටක යුද්ධයක් පවතින විට කලාකරුවන් හැසිරෙන ආකාරය සමඟ සසඳන විට සෙබළුන් 'අභිප්‍රේරණය' කිරීම යනු අපේ කලාකරුවනට තහනම් වචනයක් වී ඇත්තේ මන්ද? එවන් නිර්මාණවලට කෙදිනකවත් අන්තර්ජාතික සම්මාන නොලැබේය යන කුහක බිය නිසාද? තිස්ස අබේසේකරයන් විසින් මෙම පැනයන්ට මෙතෙක් කල් සිටියා සේ අමතක කර නොසිට ඊළඟ සතියේදීවත් පිළිතුරු දේ යැයි මම බලාපොරොත්තු වෙමි.

භාරතීය සිනමාවේ ඉතා ජනප්‍රියව සිටි අසහාය නළුවකු වූ සුනිල්දත් ගෙන් වරක් ඉන්දීය ජනමාධ්‍යකරුවන් මෙවන් ප්‍රශ්නයක් ඇසීය. 'ඔබේ අදහසට අනුව පනස් වසරක ඉතිහාසය තුළ ඉන්දීය සිනමාවෙන් ඉන්දීය සමාජයට සිදුවූ සේවය සහ දායකත්වය කුමක්ද?'

ඊට පිළිතුරු වශයෙන් එක් සුන්දර උදාහරණයක්ද දක්වමින් සුනිල් දත් විසින් මෙසේ පවසා ඇත.

'මීට වසර කිහිපයකට පෙර මා නවදිල්ලි නුවර ආපන ශාලාවක සිටියදී එක් රූමත් දැරියක් ඉතා මිහිරි නදින්, නියම වාග් ව්‍යවහාරයෙන් යුක්තව, ජනප්‍රිය හින්දි සිනමා ගී වැලක් ගායනා කරනු දුටිමි. ආහාරගෙන අවසානයේ ආපන ශාලාවෙන් පිටවී යෑමට පෙර මා ඇය වෙතට ගොස් ඇයට ස්තුති කිරීමට හින්දි බසින් ඇය ඇමතීමි. ඕ කිසිත් නොකියා මා වෙත හිස් බැල්මක් හෙළුවාය. ඈ ළඟ සිටි අයෙක් මට පැවසුවේ ඇය මිසෝරාම් ජාතික තරුණියක් බවත් ඇයට හින්දි භාෂාව කතා කළ නොහැකි බවත්ය. (ඉන්දියාවේ මිසෝරාම් ප්‍රාන්තයේද බෙදුම්වාදී ත්‍රස්තවාදයක් ඇත.) එසේ නම් ඉන්දීය සිනමාව ඉන්දීය සමාජයට දුන් දායාදය ලෙස මා දකින්නේ ජාතීන් අතර එකමුතුව ඇතිකරලීමට, අන්‍යෝන්‍ය සුහදතාව ජනිත කිරීමට සහ ත්‍රස්තවාදය හුදෙකලා කිරීමට එමගින් දැරූ මහඟු දායකත්වයයි. 'මදර් ඉන්දියා' වැනි චිත්‍රපටයක් සාද එහි ගීත කීයක් අඩංගු කළ යුතුදැයි මගෙන් අසන්නට 'අමතක වූ' තිස්ස අබේසේකරට අවශ්‍ය උපදෙස් මාලාවම සුනිල්දත්ගේ ඉහත සඳහන් පිළිතුරෙහි ගැබ්ව ඇතැයි මට සිතේ.

ගැටවර වියේදීම සිනමා කර්මාන්තයට පිවිස සිනමාව තුළම වයෝවෘද්ධභාවයට පත්ව සිටින තිස්ස අබේසේකරගෙන් ජාතීන් අතර සමගියට මෙතෙක් සිංහල සිනමාව දැරූ දායකත්වය කුමක්දැයි යමෙක් විමසුවොත් ඔහු ඊට මෙසේ පිළිතුරු දෙනු නිසැකය. 'අපි අපේ සිනමා නිර්මාණ තුළින් රට බෙදීමට තැත් කරන ත්‍රස්තයා සමඟ යුද කරන සෙබළා සහ ඔහුට දිරිය දෙන සෙබළ බිරියගේ ආත්ම ගෞරවයට සියුම්ව පහර දී ඉතා සූක්ෂ්ම අයුරින් සෙබළුන්ට සහ සිංහල ජනතාවට යුද්ධය පිළිකුල් කරවීමට කටයුතු කළෙමු. එසේම, සිංහල ජාතිය සදාචාරයක් රහිත, සාරධර්මයන්ගෙන් තොර, වනචාරී ජාතියක් ලෙස ලොවට වක්‍රව කියාපාමු. එවිට අනාගතයේදී, අන්තර්ජාතික ප්‍රජාවගේ අනුකම්පාව ත්‍රස්තයාට ලැබෙන අතර යුද්ධය පිළිකුල් වී එක්කෝ සෙබළුන් හමුදව හැරයනු ඇත. එසේත් නැත්නම් යුද්ධ නොකර සිටිනු ඇත. එවිට ත්‍රස්තයා ඊළම දිනාගන්නා හෙයින් යුද්ධය නවතී. රටට සාමය උදාවෙයි. ජාතීනු සමගි වෙති. අපේ ජීවිතවලට එල්ල වන 'විවිධ තර්ජන' හමුවේ නිර්භීතව කටයුතු කරමින් රටට තිරසාර සාමයක් ගෙනඒම සඳහා ශ්‍රී ලංකාවේ සිංහල සිනමාව දරන්නා වූ මහඟු දායකත්වය එයයි' මෙය කෙතරම් කදිම 'කලාකාමී', 'සාමකාමී', 'මානව හිතවාදී', පිළිතුරක්ද?

රටේ පවතින 'සංකීර්ණ' ප්‍රශ්නය හමුවේ වියපත් සිනමාකරුවකු ලෙස අද තිස්ස අබේසේකරයන් විසින් කළ යුත්තේ ජීවිතයේ සැඳෑසමයට එළඹෙනතුරුම තමාට කිරීමට නොහැකි වූ, දෙමළ සිංහල ජාතීන් අතර සමගිය උදකරලීමට අංශු මාත්‍රයකින් හෝ දායකවන නිර්මාණ කිරීමට, තරුණ සිනමාකරුවන් දිරිමත් කිරීම මිස, ගැබ්බර සිංහල මවුවරුන් සහ උතුරේ සටන් වදින සෙබළුන්ගේ තරුණ බිරින්දන් පරපුරුෂයන් සමඟ පදුරු අස්සේ සහ ගස් දෙබල් අතර සංසර්ගයේ යෙදෙන අශික්ෂිත දර්ශනද, අහිංසක කුඩා දැරියක් යොදගනිමින් ප්‍රවත්පතක සඳහන් කිරීමටවත් නොහැකි තරමේ නිහීන දර්ශනද, ඉතාමත් අසභ්‍ය වූ දෙබස්ද, ඇතුළත් කරමින් ඊනියා 'යුධ' චිත්‍රපට නිර්මාණය කරන 'සිනමා නරුමයනට' සුදුහුණු ගෑම නොවේ. දෙමළ දූදරුවන්ටද සිංහල දූපුතුන් හා එක්ව එකට නැරඹිය හැකි, නරඹා අහිංසක ප්‍රීතියක් ලබාගත හැකි, නිර්මාණ කිරීමට දිරි දීමයි. දෙමළ ජනතාවටද රසවිඳිය හැකි, ආශ්වාදයක් ලැබිය හැකි සුන්දර සිංහල සිනමාවක් එළිදැක්වීමට තරුණ සිනමාකරුවන්ට උපදෙස් දීමයි. එසේ බැරිනම්, ලක්මවු කුසේ ඉපදුන පුතෙක් ලෙස, රටේ යහපත උදෙසා කිසිත් නොකර සිටීම වෙනුවට, මෙසේ කටයුතු කිරීම කෙසේ නම් ඉවසමිද?